## ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් වර්ගීකරණය සහ සුචිකරණය පිළිබඳ අධ්‍යයනයක්.

එස්.එම්. තුෂාර නලින්ද සේනානායක.[1]

ලක්දිව ලේඛන කලාව ක්‍රි.පු තුන්වන සියවසයෙනුත් එහා දිගු ඉතිහාසයකට නෑකම් කියනු ලබන අතර එහි වර්ධනීය අවස්ථාවක් ලෙස පුස්කොළ පොත් ලේඛන සම්ප්‍රදාය හඳුනාගත හැක. ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයෙහි වැදගත් සංදිස්ථානයක් ලෙස සැලකෙන අනුරාධපුර යුගයෙහි පටන්ම මෙරට ලේඛන කලාව පුස්කොළ ආශ්‍රිතව ගොඩනැගෙනු දක්නට ලැබේ. මුල්කාලීනව පුස්කොළ පොත් සම්ප්‍රදාය ආගමික මුහුණුවරක් ගනිමින් ව්‍යාප්ත වුවද පසු කාලීනව විවිධ ක්ෂේත්‍ර යටතේ විකාශනය වූ පුස්කොළ පොත් ලේඛන කලාව මහනුවර යුගයේ අවසානය දක්වාම ලක්දිව ලේඛන සම්ප්‍රදාය රැක ගනිමින් ව්‍යාප්ත වීම දැකිය හැකි වේ. දේශීය අනන්‍යතාවය යටතේ නිර්මාණය වූ පුස්කොළ පොත් ලේඛන සම්ප්‍රදාය වර්ගීකරණය ආශ්‍රිතව සහ සුචිකරණය ආශ්‍රිතව පැණ නැගී ඇති ගැටලු පිළිබඳව අධ්‍යයනයේදී පැහිදිලි වුයේ පොදු ඒකමතියක් හෝ ප්‍රමිතියක් පිළිබඳව අදහස් ඉදිරිපත් නොවීමය. එසේ හෙයින් ඒ පිළිබඳව අධ්‍යනයක නියැලීම කාලෝචිත යැයි අදහස් කළ බැවින් ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් වර්ගීකරණය සහ සුචිකරණය පිළිබඳව අධ්‍යනයක් කිරීම මෙමඟින් අපේක්ෂා කරනු ලැබේ. මෙම අධ්‍යනයෙහි මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් වර්ගීකරණය සහ සුචිකරණය හඳුනාගැනීමත්, පුස්කොළ පොත් වර්ගීකරණයෙහි ඉතිහාසය ගවේශණය කිරීමත්, පුස්තකාල ක්ෂේත්‍රය තුළදී පුස්කොළ පොත් වර්ගීකරණයේදී සහ සුචිකරණයේදී ඇතිවන ගැටලු පිළිබඳව විමර්ෂණාත්මකව අධ්‍යයනය කිරීමය. පර්යේෂණය සඳහා කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයනය හා පර්යේෂණ පුස්තකාලයයෙහි පුස්කොළ පොත් එකතුවත් ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි පුස්කොළ පොත් එකතුවත් ආශ්‍රයෙන් සිදු කිරීමට නියමිත වේ. අධ්‍යයනයේදී අනාවරණය වු වැදගත් කරුණක් වුයේ ශ්‍රී ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය තුළ පවත්වාගෙන ගිය පුස්කොළ පොත් කිසියම් වූ වර්ගීකරණයකට ශාස්ත්‍රීය වශයෙන් සිදු වුවා සේම සුචිකරණයේදී පොදු පිළිගත් එකඟතාවයක් මත සිදු නොවු බවක් අධ්‍යයනයේදී නිගමනය කළ හැකි වීමය. එසේ වුවද  එය පසුකාලීනව කරන ලද වර්ගීකරණයන් අතර සමානතාවයක් දක්නට ලැබෙන බව අධ්‍යයනයේදී හුඳුනාගත් කරුණු අතර වේ.

**key Word : පුස්කොළ පොත්, පොත් ගුල, වර්ගීකරණය, සුචිකරණය.**

[1] පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය.සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය Senanayake19@yahoo.com